සියලු ම හිමිකම් ඇවිරිණි

**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

**පදනම් විභාගය - 2012 ජනවාරි**

# (52) ආර්ථික විද්‍යාව
Economics

2012-01-21
පස්වරුව
[2.00 - 4.00]

**කාලය: පැය 02 යි.**

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන : 07

- **අයදුම්කරුවන්ට උපදෙස්:**
  *(1)* මෙම පත්‍රය **A** සහ **B** යන කොටස් දෙකකින් (02) යුක්ත වේ.
  *(2)* පහත දැක්වෙන පරිදි ප්‍රශ්න **පහකට (05)** උත්තර ලිවිය යුතුය.
    - **A කොටසේ අංක 01 දරණ ප්‍රශ්නයට, සහ**
    - **B කොටසේ ඕනෑම ප්‍රශ්න හතරකට (04).**
  *(3)* ඉල්ලුම් කරන ලද **මාධ්‍යයට** අදාළව, **එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.
  *(4)* ප්‍රස්තාර කොළ සපයනු ලැබේ.
  *(5)* *ලකුණු 100.*

---

## A - කොටස
බහුවරණ ප්‍රශ්න
මෙම කොටසේ සියළු ම ප්‍රශ්න වලට උත්තර ලියන්න.
ලකුණු 40.

**01.** පහත සඳහන් එක් එක් ප්‍රශ්නයට **වඩාත්ම නිවැරදි** උත්තරය (1), (2), (3), (4) අතුරෙන් තෝරන්න. එසේ තෝරාගත් උත්තරයට අදාළ ඉලක්කම, ප්‍රශ්නයට යොදා ඇති ඉංග්‍රීසි අක්ෂරය සමග පිළිතුරු පොතේ ලියන්න.

(A) රටක දක්නට ලැබෙන අඛණ්ඩව ක්‍රියාත්මක වන ආර්ථික ක්‍රියාවලින් බෙදිය හැකි වන්නේ:

(1) ගොවිතැන, කැනීම්, නිෂ්පාදනය ලෙසය.

(2) නිෂ්පාදනය, බෙදා හැරීම, පරිභෝජනය ලෙසය.

(3) මිනිස් උවමනාවන්, සම්පත්, හිඟකම ලෙසය.

(4) කෘෂිකර්මය, කර්මාන්ත, සේවා ලෙසය.

(B) "මානව ප්‍රාග්ධනයෙහි" අර්ථය වන්නේ:

(1) ශ්‍රම බලකායෙහි ප්‍රසාරණයයි.

(2) ශ්‍රමයෙහි වැඩි දියුණු කළ ගුණාත්මක තත්ත්වයයි.

(3) මිනිසා විසින් නිපදවන ලද සියළු සම්පත් නිෂ්පාදනයේදී යොදා ගැනීමයි.

(4) මානවයාගේ මානසික හෝ කායික හැකියාව නිෂ්පාදන අරමුණ සඳහා යොදා ගැනීමයි.

(C) භාණ්ඩයක් සඳහා මිල ඉල්ලුම් නම්‍යතාවය අනම්‍ය නම්, එවිට 1% කින් මිල වැඩිවීමෙන් ඇති වන ප්‍රතිඵලය වන්නේ:

(1) 1% ට වඩා අඩු ප්‍රතිශතයකින් ඉල්ලුම් ප්‍රමාණයෙහි අඩු වීමකි.

(2) 1% ට වඩා වැඩි ප්‍රතිශතයකින් ඉල්ලුම් ප්‍රමාණයෙහි අඩු වීමකි.

(3) 1% ට සමානුපාතිකව ඉල්ලුම් ප්‍රමාණය වෙනස් වීමකි.

(4) මුළු අයභාරයෙහි පහත වැටීමකි.

(D) ඇඟළුම් සඳහා සැපයුම් වක්‍රය දකුණට විතැන් වීමට පහත සඳහන් ද අතුරෙන් හේතු වන්නේ?

(1) පාරිභෝගිකයින්ගේ ආදායමෙහි වැඩි වීමක්.

(2) ඇඟළුම් නිෂ්පාදනය සඳහා භාවිත කරන ආනයනය කරනු ලබන කපු නූල් මත පනවන බද්දෙහි අඩුවීමක්.

(3) ඇඟළුම් නිෂ්පාදකයන්ගේ සංගමය මගින් කරනු ලබන සාර්ථක ප්‍රචාරණ ව්‍යාපාරයක්.

(4) ඇඟළුම් වල විකුණුම් මිලෙහි වැඩිවීමක්.

(E) *x* හා *y* භාණ්ඩ දෙකේ නිෂ්පාදන හැකියා වක්‍රය **A** සහ **B** පහත සඳහන් ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරයි.




එය $\mathbf{A_1\ B_1}$ සහ $\mathbf{A_2\ B_2}$, යන තැන් වලට විතැන් වී ඇති අවස්ථාවක ආර්ථික වර්ධනය පෙන්නුම් කරනු ලබන්නේ:

(1) **M** සිට **N** දක්වාය. (2) **N** සිට **M** දක්වාය.

(3) $\mathbf{A_1\ B_1}$ වලිනි. (4) $\mathbf{A_2\ B_2}$ වලිනි.

(F) "උපේක්ෂා වක්‍ර සිතියම" යන්නෙන් අදහස් කරන්නේ:

(1) විවිධ මට්ටම්වල නිෂ්පාදන ලබා දෙන නිෂ්පාදන හැකියා වක්‍ර සමූහයකි.

(2) සමාන තෘප්තියක් ලබාදෙන උපේක්ෂා වක්‍ර සමූහයකි.

(3) විවිධ මට්ටම් වල තෘප්තියක් ලබා දෙන උපේක්ෂා වක්‍ර සමූහයකි.

(4) විවිධ මට්ටම් වල ඉල්ලුම පෙන්නුම් කරන ඉල්ලුම් වක්‍ර සමූහයකි.

(G) *x* භාණ්ඩය සඳහා ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර පහත සඳහන් ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරයි.




නිෂ්පාදන අතිරික්තය පෙන්නුම් කරන ප්‍රදේශය වන්නේ:

(1) $\mathbf{PP_2\,E}$ (2) $\mathbf{P_1\,PE}$ (3) $\mathbf{P_1\,OQE}$ (4) **OPEQ**

(H) වෙළෙඳ භාණ්ඩයක් සඳහා ඉල්ලුම් සහ සැපයුම් වක්‍ර පහත සඳහන් ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කරයි.




රජය විසින් උපරිම මිලක් $P_1$ වලදී පනවනු ලැබුවහොත්, අධි (excess) ඉල්ලුම වන්නේ:

(1) $Q - Q_1$ (2) $Q_1 - Q_2$ (3) $Q_2 - Q$ (4) $O - Q_2$

(I) "ඉල්ලුම් නම්‍යතාවය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

(1) මිල ඉහළයාමකින් පාරිභෝගිකයාට නිෂ්පාදිතය සඳහා වැඩියෙන් වියදම් කිරීමට පෙළඹවීමයි.

(2) මිල ඉහළයාමකින් ඉල්ලුම් ප්‍රමාණයේ අඩුවීමක් ඇති වීමයි.

(3) මිල වෙනස්වීමකට වියදම වෙනස්වීමෙහි ප්‍රතිචාරාත්මක බලපෑමයි.

(4) ඉල්ලුමට බලපාන මිල, ආදායම සහ වෙනත් භාණ්ඩවල මිල වෙනස් වීමකට ඉල්ලුම් ප්‍රමාණයේ ඇතිවන ප්‍රතිචාරාත්මක බලපෑමයි.

(J) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව 2010 වර්ෂයෙහි ශ්‍රී ලංකාවේ ඒකපුද්ගල ආදායම (දළ දේශීය නිෂ්පාදිතය වශයෙන්) වන්නේ:

(1) ඇමරිකානු ඩොලර් 2,057 කි. (2) ඇමරිකානු ඩොලර් 2,014 කි.

(3) ඇමරිකානු ඩොලර් 2,033 කි. (4) ඇමරිකානු ඩොලර් 2,399 කි.

(K) "අතරමැදි භාණ්ඩ" විස්තර කරන වගන්තිය පහත සඳහන් දෑ අතුරෙන් තෝරන්න:

(1) එක් වරකට වඩා භාවිත කළ හැකි භාණ්ඩ.

(2) පාරිභෝගිකයාගේ අවශ්‍යතාවයන් සහ උවමනාවන් ඍජුවම තෘප්තිමත් කරනු ලබන භාණ්ඩ.

(3) නිම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය සහ යෙදවුම් වශයෙන් භාවිත කරන භාණ්ඩ.

(4) ඵලදායී නමුත් භාවිතය නිසා ක්ෂය වන භාණ්ඩ.

(L) ආදායම් වෘත්ත ප්‍රවාහයෙන් ගිලිහීමක් ලෙස හැඳින්විය හැක්කේ පහත සඳහන් දෑ අතුරෙන් කුමක්ද?

(1) නිර්යාත. (2) ආයෝජන. (3) රජයේ වියදම්. (4) බදු.

(M) රටක එක් වර්ෂයක් සඳහා ජාතික ආදායම් විස්තර පහත සඳහන් වගුවෙන් පෙන්නුම් කරයි.

| | රු. (දශ ලක්ෂ) |
|---|---|
| දළ ජාතික නිෂ්පාදිතය වෙළෙඳපොල මිලට | 50 |
| වක්‍ර බදු | 9 |
| සහනාධාර | 1 |
| අපනයන | 5 |
| ආනයන | 6 |
| ප්‍රාග්ධන පරිභෝජනය | 5 |

සාධක පිරිවැය මිලට ශුද්ධ ජාතික නිෂ්පාදිතයෙහි වටිනාකම වනුයේ:

(1) රු. දශ ලක්ෂ36 කි. (2) රු. දශ ලක්ෂ 37 කි.

(3) රු. දශ ලක්ෂ 42 කි. (4) රු. දශ ලක්ෂ 45 කි.

(N) පටු මුදල් සැපයුම යටතේ මුදල් සැපයුම මැනීමේදී පහත සඳහන් දෑ අතුරෙන් අන්තර්ගත වන්නේ:

(1) මහජනයා සතු ඉල්ලුම් තැන්පතුය.

(2) වාණිජ බැංකුවල මහජනයා සතු ඉතිරිකිරීම් සහ කාලීන තැන්පතුය.

(3) වාණිජ බැංකුවල මහජනයා සතු නේවාසික හා අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල ශේෂයන්ය.

(4) බැංකු නොවන මූල්‍ය ආයතනවල මහජනයා සතු ඉතිරිකිරීම් හා කාලීන තැන්පතුය.

(O) රටක සාමාන්‍ය මිල මට්ටම වැඩිවීමක ආසන්නතම ප්‍රතිඵලය වන්නේ:

(1) විරැකියා මට්ටම පහත වැටීමය.

(2) ආයෝජන මට්ටම පහත වැටීමය.

(3) මුදලෙහි මූර්ත අගය පහත වැටීමය.

(4) වැය කළ හැකි පෞද්ගලික ආදායම පහත වැටීමය.

(P) පහත සඳහන් දෑ අතුරෙන් මුදලෙහි ගති ලක්ෂණයක් **නොවන්නේ:**

(1) නෛසර්ගික වටිනාකම මුහුණත වටිනාකමට සමාන විය යුතු වීමය.

(2) කුඩා කොටස් වලට බෙදිය හැකි වීමය.

(3) පොදු පිළිගැනීමය.

(4) ගෙන යාමේ පහසු වීමය.

(Q) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාවට අනුව, වර්ෂ අවසානයෙහි ශ්‍රී ලංකා ආර්ථිකයේ විදේශ විනිමය අනුපාතිකය එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව:

(1) රු.110.95 ක් විය. (2) රු.108.33 ක් විය.

(3) රු.114.94 ක් විය. (4) රු.113.06 ක් විය.

(R) පහත සඳහන් දෑ අතුරෙන් රජයේ වර්තන වියදමක් **නොවන්නේ:**

(1) රාජ්‍ය ණය සඳහා පොලී ගෙවීමය.

(2) රජය මගින් ගෙවන ලද නියං සහනාධාරය.

(3) රාජ්‍ය සේවකයන්ට රජය මගින් ගෙවන ලද වැටුප් හා වේතනය.

(4) රජය මගින් මූර්ත වත්කම් අත්පත් කර ගැනීමය.

(S) පහත සඳහන් දෑ අතුරෙන් වක්‍ර බද්දෙහි ගති ලක්ෂණයක් **නොවන්නේ:**

(1) බදු නිතරම වෙනත් පාර්ශවයකට පැවරිය හැකි වීමය.

(2) එය වෙනත් පාර්ශවයකට පැවරිය නොහැකි වීමය.

(3) භාණ්ඩ මිලදී ගන්නා අවස්ථාවේදී පමණක් බද්ද ගෙවනු ලැබීමය.

(4) බදු සාමාන්‍යයෙන් ප්‍රතික්‍රමික බදු ලෙස හඳුන්වනු ලැබීමය.

(T) රටක ආර්ථික සංවර්ධනය සම්බන්ධයෙන් අධිවේගී මාර්ග ව්‍යාපෘති වල ප්‍රධානම ප්‍රතිලාභය වන්නේ:

(1) ප්‍රවාහන සේවා ලාභදායකව සැපයිය හැකි වීමය.

(2) සංචාරක කර්මාන්තයට අත්‍යාවශ්‍ය වීමය.

(3) තුලනාත්මක ප්‍රාදේශීය සංවර්ධනයේ තීරණාත්මක සාධකයක් වීමය.

(4) නියමිත වේලාවට ප්‍රවාහනය සැපයිය හැකි වීමය.

(එකකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 40)

## B - කොටස

මෙම කොටසෙන් **ඕනෑම ප්‍රශ්න හතරකට (04)** පමණක් උත්තර ලියන්න.

ලකුණු 60

**02.** (a) මධ්‍යගත සැලසුම්ක්‍රමය සහ මිශ්‍ර ආර්ථික ක්‍රමය මගින් මූලික ආර්ථික ගැටළු විසඳනු ලබන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 09)

(b) වෙළෙඳපොල ආර්ථික ක්‍රමයෙහි දූර්වලතා හතරක්(04) ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

(c) ආවස්ථික පිරිවැයෙහි හැසිරීමේ ස්වභාවයන් දෙකක්(02) ලැයිස්තුගත කරන්න. (ලකුණු 02)

(මුළු ලකුණු 15)

**03.** (a) නිෂ්පාදන න්‍යාය තුල දක්නට ලැබෙන "කෙටිකාලය" සහ "දිගුකාලය" අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(b) ප්‍රස්ථාරයක ආධාරයෙන් ඒකාධිකාරී ආයතනයක කෙටිකාලීන සමතුලිතතාවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(c) පූර්ණ තරගය සහ ඒකාධිකාරය අතර වෙනස්කම් හයක්(06) ලැයිස්තුගත කරන්න. (ලකුණු 06)

(මුළු ලකුණු 15)

04. (a) ආන්තික උපයෝගිතා න්‍යාය යටතේ පාරිභෝගික සමතුලිතතාවය සඳහා අවශ්‍ය කොන්දේසි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(b) මිල වෙනස්වීමක ආදායම් ප්‍රතිවිපාකය සහ ආදේශන ප්‍රතිවිපාකය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(c) සැපයුම් නම්‍යතාවය තීරණය කරන සාධක සඳහන් කරන්න. (ලකුණු 03)
(මුළු ලකුණු 15)

05. (a) රටක ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් (macro economic variables) ලැයිස්තුගත කරන්න. (ලකුණු 04)

(b) වර්තන මිලට දළ ජාතික නිෂ්පාදිතය (Gross National Product - GNP) සහ ස්ථාවර මිලට දළ ජාතික නිෂ්පාදිතය අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05)

(c) (i) ඒකපුද්ගල ආදායම යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද? (ලකුණු 02)

(ii) රටක ජීවන මට්ටම මැනීමට ඒකපුද්ගල ආදායමෙහි ඇති සීමාවන් පැහැදිලි කරන්න. (ලකුණු 04)
(මුළු ලකුණු 15)

06. (a) මුදලේ කාර්යයන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(b) "ආසන්න මුදල්" යන්න විස්තර කර උදාහරණ දෙකක්(02) ලියන්න. (ලකුණු 04)

(c) (i) "ඉල්ලුමෙන් ඇදුන උද්ධමනය" (Demand Pull Inflation) යනු කුමක්ද? (ලකුණු 02)

(ii) රටක ඉල්ලුමෙන් ඇදුන උද්ධමනකාරී තත්ත්වයන් ඇතිවීම සඳහා බලපානු ලබන හේතු තුනක්(03) ලැයිස්තුගත කරන්න. (ලකුණු 03)
(මුළු ලකුණු 15)

07. (a) රාජ්‍ය අයවැය ලේඛණයක ප්‍රධාන ලක්ෂණ මොනවාද? (ලකුණු 05)

(b) බදු අයකිරීමේ පරමාර්ථ සඳහන් කරන්න. (ලකුණු 05)

(c) රාජ්‍ය ණයවල ආර්ථික ප්‍රතිවිපාක ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)
(මුළු ලකුණු 15)

- o0o -